# ලෝකයේ දුරින්ම පිහිටි දූපත















අභ්‍යවකාශයට පෙනෙන ආකාරය

ලෝකයේ දුරින්ම පිහිටි දූපත ලෙස Tristan da Cunha දූපත් සමූහය හඳුනා ගැනෙයි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් මෙම දූපත් සමූහය ආසන්නතම රට දකුනු අප්‍රිකාව වන අතර එය දකුණු අප්‍රිකාවේ සිට කිලෝ මීටර 2400 කට වඩා වැඩි දුරකින්ද දකුණු ඇමරිකාවේ සිට කිලෝ මීටර 3360 ක් දුරකින්ද පිහිටා තිබේ. මේ දූපත් සමූහයට ආසන්නම මිනිස් වාසය ඇත්තේ කිලෝ මීටර් 2000ක් දුරින් පිහිටි සෙන්ට් හෙලේනා දූපතයි.

දකුණු අප්‍රිකාවේ සිට බෝට්ටුවකින් ගමන් ගන්නේ නම් එම ගමනට දින 6ක් වැයවෙයි.දකුණු අත්ලාන්තික් සාගරය මැද පිහිටා ඇති මෙම දූපත් සමූහයට දූපත් 6ක් අයත් වෙයි. විශාලම ප්‍රධාන දූපතේ දිග කිලෝ මීටර් 11ග27 ක් වන අතර වර්ගඵලය වර්ග කිලෝමීටර 98ක් වෙයි.

මෙම දූපත් පළමු වතාවට සොයා ගත්තේ ක්‍රිව 1506 දී පෘතුගීසින් යි. ප්‍රථම වතාවට දූපගට ගොඩ බැස්සේ ක්‍රිව 1643 දීයි. දූපතේ පළමු ස්ථිර පදිංචික- රුවා 1810 දෙසැම්බර් මාසයේ දී පදිංචියට ආ ජොනතන් ලැම්බර්ට් යි.

2014 සංගණනය අනුව මෙම දූපත් රාජ්‍යයේ පවුල් 80 කට අයත් පුද්ගලයින් 297 දෙනෙක් ජීවත් වෙති.ඔවුන් සියලූ දෙනාටම ඇත්තේ වාසගම් 7ක් බව විදෙස් වාර්තා කියයි. මේ වනවිට වෙනත් කිසිදු කෙනෙකුට මෙහි පදිංචි වීමට අවසර නොමැති බව ද වාර්තා වෙයි. බ්‍රිතාන්‍යයට වග කියන ආණ්ඩුකාරවරයෙක් යටතේ මෙම දිවයින පාලනය කරයි.

බ්‍රිතාන්‍යයන් ලැබෙන මුදල් වලින් මෙම දූපත පාලනය වන අතර බ්‍රිතාන්‍යයට අවශ්‍ය මාළු සැපයීම මෙම දූපතෙන් සිදුකෙරෙයි. ධීවර කර්මාන්තයට ඉතා හිතකර ස්වාභාවික වරායවලින් සමන්විත මෙම දිවයින් ආසන්නයේ මත්ස්‍ය සම්පතද බහුල බව විදෙස් වාර්තා කියයි.

ගොල්ෆ් පිට්ටනියක් , පාසැල්, සහ දේවස්ථානයකින් සමන්විත මෙම දිවයිනට අන්තර්ජාල පහසුකම් පවා ලැබී ඇත්තේ 2006 දී බව වාර්තා වෙයි.මේ වනවිට එහි ඔන්ලයින් පුවත්පතක් සහ රූපවාහිනි මෙන්ම ගුවන් විදුලි නාලිකාවක් ද ක්‍රියාත්මක වෙයි.

මෙම දිවයිනේ වැසියන්ට ආර්ථික ගැටළු නොමැති අතර බොහෝ දෙනා විවේකිව කාලය ගත කරන බව විදෙස් වාර්තා කියයි.

ආරාධනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය, මෙල්බර්න්හි ශ්‍රී ලාංකික ප්‍රජා සංවිධාන හා සමග සංවිධානය කරනු ලබන

ශ්‍රී ලංකාවේ හැට හත් වැනි නිදහස් දින සංවත්සරය සැමරීමේ උත්සවය

*2015 පෙබරවාරි මස 04 වැනි බදාදා*
*පස්වරු 7.00 සිට 9.30 දක්වා*

*වික්ටෝරියාවේ, වොන්ටර්නා සවුත්, කැතීස් ලේන්හි අංක 90 දරණ ස්ථානයේ පිහිටි*
*'ද ග්‍රෑන්ඩ් ' ශාලාවේදී පැවැත්වේ.*

එයට සහභාගිවන ලෙස ඔබ සැමට කෙරෙන සුහද ආරාධනයයි.

කොන්සල් ජනරාල්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සල් ජනරාල් කාර්යාලය
අංක 1, ක්වීන්ස් පාර, මෙල්බර්න්, වික්ටෝරියා 3004

විමසීම: දුරකතන අංක - 9290 4200

Victoria Mercantile LAWYERS

**Commercial Litigation**
- Motor vehicle litigation (Motor vehicle accident Claims)
- Debt Recovery
- Contract Disputes

**Business & Commercial Law**
- Sale & Purchase of Business
- Partnership Agreements
- Employment Agreements
- Commercial Leases

**Wills**

**Powers of Attorney**

**Conveyancing**
- Sale & Purchases
- Contract of Sales
- Auction Contracts
- Vendor Statements
- Subdivisions

**Family Law**
- Divorce
- Property Settlements
- Pre-Nuptial Agreements
- Binding Financial Agreements
- Consent Orders

(03) 9803 6225
(03) 9803 6226
info@vicmercantilelawyers.com.au
PO Box 5358 Pinewood VIC 3149
www.vicmercantilelawyers.com.au

Anne Heenatimulla LLM (Monash)
Principal
Barrister & Solicitor

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com